# උතුරු පළාතේ පාසල්වල දෙමළ, සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් වූ විෂයයන් හි පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තිය – I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – *2023*

උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක NP3/1/4/Gra.Tea/2023 හා 2023.09.18 දිනැති ලිපිය මඟින් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක ED/02/29/21/AL/02-vi වෙළුම, 2023.07.24 දිනැති, ලිපිය උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ 2023.10.13 දින දරණ අනුමැතිය හා 2021.01.26 දිනැතිව නිතුත් කරන ලද අංක 2021/01 දරණ ගරු ආණ්ඩුකාරවරයාගේ සංදේශය මඟින් නිකුත් කර තිබෙන බලතල පැවරීමට ද යටත්ව උතුරු පළාත් පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පන්තිය 3 - I(අ) ශ්‍රේණියේ තනතුරට **ඇමුණුම–01**හි සඳහන් පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. **ඇමුණුම–02**හි දක්වා ඇති පරිදි නියමිත විෂයයන්ට අදාළ සුදුසුකම් සපුරා තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ. **ඇමුණුම–01**හි සඳහන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **03.11.2023** වේ.

## *02.* බඳවා ගැනීමේ සේවා කොන්දේසි

2.1 **අංක** 1885/38 දරණ 2014.10.23වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යාවස්ථාවේ නිර්දේශිතව තිබෙන කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටි සංග්‍රහයට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් නියමිත තනතුරේ පන්තිය 3 - I(අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2 මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. මෙම බඳවාගැනීම් මඟින් තෝරා ගන්නා අපේක්ෂයන් පත්වීම් දින සිට වසර තුනක පරිවාස කාලයට යටත් කර පත් කරනු ලැබේ

2.3 මෙම සේවය ස්ථාන මාරු සහිත සේවයක් වන අතර මෙම තනතුරට පත්වන අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්ව බැඳී සිටිය යුතුයි.

2.4 පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලබයි. නිවේදනය කර තිබෙන පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩුවක් හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලතල ද පත්වීම් බලධාරියා සතුය.

2.5 පත් කරන පාසල සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරන ඕනෑම තීරණයකට අයදුම්කරුවන් යටත්විය යුතු

2.6 අංක 18/2020 හා 2020.10.16වන දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව රාජ්‍ය භාෂා කුසලතාව සම්පූර්ණ කළ යුතුයි.

## *03.* වැටුප් පරිමාණය

පන්තිය 3 - I(අ) ශ්‍රේණියේ තනතුරට අලුතින් බඳවා ගනු ලබන ගුරුවරයකු පත්වීම් බලාත්මක වන දින සිට අංක 03/2016(iv) දරණ 2022.08.05**වන දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව**, **GE 1-2016-A දරණ වැටුප් සංකේත අංකය යටතේ රුපියල්** 31490 – 445x 6 – 525 x 7 – 600 x 2 – 39,035 **ක** මාසික වැටුප් ප්‍රමාණයේ 14වන වැටුප් පියවර වන රුපියල් **37,835/-**හි පිහිටුවනු ලැබේ. මීට අතිරේක වශයෙන් රජයේ නිලධාරීන් හට කලින් කලට ගෙවන දීමනා ද ලබා ගැනීමට හිමිකම් ඇත.